# පොළොන්නරු යුගයේ හින්දු සංකල්ප නිසා ඇතිවූ බෞද්ධ කලාවේ අභිවර්ධනය

අංජලී වික්‍රමසිංහ[1]

## හැඳින්වීම

පොළොන්නරු යුගය වන විට දක්ෂිණ භාරතීය බලපෑම් ප්‍රබල වීම නිසා සිංහල සංස්කෘතියට හින්දු සංස්කෘතික ලක්ෂණ ප්‍රවේශ විය. එම ප්‍රවේශය බෞද්ධ ආගමික පදනම කෙරෙහි දැඩි බලපෑමක් එල්ල නොකළ ද එය දිවයිනේ ඇති වූ දෘශ්‍ය කලා ඉතිහාසයේ විශේෂත්වයක් සටහන් කළ අවස්ථාවක් ලෙස සැලකිය හැකිය. සිංහල බෞද්ධ සමාජයට පිවිසුණු ද්‍රවිඩ හින්දු සංස්කෘතිය සමකාලීන සමාජ පරිසරයට ද, පසුකාලීන සමාජ සහ සංස්කෘතික පරිසරයට ද කලාවට ද බලපෑවේය. එම කලාව විටෙක හින්දු නිර්මාණ සම්ප්‍රදාය අනුගමනය කරන්නක් වන අතර තවත් විටෙක සමාප්‍රයෝගයෙන් හින්දු සංකල්ප බැහැර කරන්නක් ද වෙයි. පොළොන්නරු නිර්මාණ සම්ප්‍රදායේ දී හමු වන බෞද්ධ කලා නිර්මාණවල දක්නට ලැබෙන එම නිර්මාණාත්මක සම්මිශ්‍රණය විමර්ශනය කිරීම මෙම අධ්‍යයනයෙහි පරමාර්ථයයි.

## මූලාශ්‍රය

පොළොන්නරු රාජධානි සමය ප්‍රමුඛ පර්යේෂණ ක්ෂේත්‍රය ලෙස යොදාගත් අතර සමකාලීන මූර්ති නිර්මාණය වී ඇති වෙනත් පුරාවිද්‍යාස්ථාන කෙරෙහි ද අවධානය යොමු විය. පුරාවිද්‍යාත්මක සාධක මෙන් ම ඓතිහාසික මූලාශ්‍රය, සාහිත්‍යයික මූලාශ්‍රය හා ජනශ්‍රැති මූලාශ්‍රය කෙරෙහි ද සමකාලීන කලා සම්ප්‍රදාය හා විචාර සංකල්ප කෙරෙහි ද විදේශීය බලපෑම් නිසා ඇති වූ දේශීය සංස්කෘතික ප්‍රවණතා කෙරෙහි ද විශේෂ අවධානය යොමු විය.

## ක්‍රමවේදය

මූර්ති කලාව ද සංස්කෘතියේ ප්‍රධාන දර්ශකයක් බැවින් මූර්ති හඳුනාගැනීම, මානප්‍රමාණ දැක්වීම, කාල නිර්ණය වැනි අංශවලට පමණක් සීමා නොවී සංස්කෘතික ප්‍රතිබිම්බයක් වශයෙන් සලකා මූර්ති කලාව පිළිබඳ අධ්‍යයනය කෙරේ.

---

1 ජ්‍යෙ. කථිකාචාර්ය, සිංහල අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, anjaleew@kln.ac.lk

**ප්‍රතිඵල**

යම් යුගයක කලාව යන සමකාලීන සමාජ විඥානයේ කැඩපතයි. පොළොන්නරු යුගයේ දී ඇති වුණු සංස්කෘතික විපර්යාස එම සාහිත්‍යයේ මෙන් ම මූර්ති කලාවේ ද දක්නට ලැබේ. පොළොන්නරු සමයේ බෞද්ධාගමික නිර්මාණ සම්ප්‍රදාය හින්දු නිර්මාණ ලක්ෂණවලට අනුගත විචිත්‍ර නිර්මාණාත්මක සෞන්දර්යය ඇසුරු කළේය. එය පූර්ව මෙන් ම පශ්චාත් කාලීන කලාව හා සංසන්දනයේ දී අනන්‍ය නිර්මාණ සම්ප්‍රදායක් විශද කරයි. පොළොන්නරු නිර්මාණ සම්ප්‍රදාය යනු බෞද්ධාගමික සංකල්ප හින්දු සංකල්ප අතින් නව ප්‍රවේශගත ව වර්ධනය වූවක් බවට අර්ථකථනය කෙරේ.

**ප්‍රධාන අනාවරණය**

පොළොන්නරු යුගයේ බිහි වූ දෘශ්‍ය කලා මෙන් ම සාහිත්‍ය කෘති ද එතෙක් මෙරට පැවති සංස්කෘතියෙහිත් අනුක්‍රමයෙන් ව්‍යාප්ත වූ හින්දු සංස්කෘතියෙහිත් සංයෝගයෙන් බිහි වූ ඒවා ලෙස හැඳින්විය හැකිය. පොළොන්නරු යුගයේ දී වර්ධනය වූ දේව වාදය නිසා බුදු දහමට අභියෝගයක් එල්ල විය. එහි දී සමකාලීන ගත්කතුවරුන්ගේ මූලික අරමුණ වූයේ බුදුන් වහන්සේ කෙරෙහි අප්‍රමාණ භක්තිය වර්ධනය කර තත් අභියෝගයට ප්‍රතිචාර දැක්වීමයි. පොළොන්නරුවේ ලියැවුණු ඇතැම් ගද්‍ය කෘති බුද්ධිමතුන් පමණක් කේන්ද්‍ර කොටගත් ඒවා යැයි ඇතැමෙක් සැලකුව ද, සමස්තයක් වශයෙන් සලකා බලන විට මුලු මහත් සමාජයට ම ගැළපෙන පරිදි රචනා කළ ඒවා ලෙස සැලකීම සුදුසුය. ඒවායේ රමණීය බස්වහර, උපමා හා වැනුම් ද රැගත් විචිත්‍රත්වය එම යුගයේ සාහිත්‍යවේදීන්ගේ ද, ජනයාගේ ද වින්දන කුසලතාව, සාහිත්‍යය පිළිබඳ වූ පරිචය හා කැමැත්ත පිළිබඳ ව දෙස් දෙයි.

පොළොන්නරු යුගයේ චිත්‍ර, මූර්ති හා කැටයම් කලාවට ද බලපා ඇත්තේ මෙබඳු විචිත්‍ර සාහිත්‍යයකින් ලද පෝෂණය යැයි කිව හැකිය. **බුත්සරණෙහි** නිරූපිත බුදුන් වහන්සේ ම ප්‍රතිමාකරණයේ දී ද නිර්මාණය කරන්නට මූර්ති ශිල්පියා උත්සුක වූයේය. හින්දු දේවවාදය ව්‍යාප්ත වීම නිසා ප්‍රඥාව අබිබවා භක්තිවාදය හා අද්භූත වාදය ඉස්මතු වීම මගින් බුදුන්වහන්සේ කෙරෙහි හටගත් අසීමිත භක්තිය කලාව කෙරෙහි ඍජු බලපෑමක් ඇති කළේය. මෙම යුගයේ ආගමික සන්නිවේදනය සිදු වූයේ විචිත්‍ර නිර්මාණ රීතිය කෙරෙහි නැඹුරු වීමෙනි. විරාගී පාලි රීතියට වඩා සරාගී සංස්කෘත රීතිය ද ලෞකික විෂය ජීවිතය ද බෙහෙවින් ආශ්‍රය කළ **කව්සිළුමිණ** වැනි මහා කාව්‍ය ද සංස්කෘත විචාර සංකල්ප ද අද්භූත හා සරාගී දේව කථාදිය ද ජනප්‍රිය භාවයට පත්වීම මෙම යුගයේ නිර්මාණවල විචිත්‍රත්වයට හේතු වී ඇත.

හින්දු ශිල්ප කලා සම්ප්‍රදායේ විචිත්‍රත්වය එක් පසකින් අනුගමනය කළ ද පොළොන්නරු නිර්මාණ ශිල්පියා හින්දු සංකල්ප නිසා බෞද්ධාගමට ඇතිවිය

හැකි අභියෝග සූක්ෂ්මව පරාජය කරන්නට උත්සුක වූයේය. පොළොන්නරු බුද්ධ ප්‍රතිමාව ආධ්‍යාත්මික සමාධියට වඩා කායික පරාක්‍රමය ප්‍රදර්ශනය කරන්නේ බුදුන්වහන්සේගේ දේවාතිදේව බ්‍රහ්මාතිබ්‍රහ්ම ස්වභාවය පෙන්වීමේ පරමාර්ථයට අනුකූල වන අයුරිනි. හින්දු දෙවියන්ගේ බල පරාක්‍රමය බුදු දහමට තර්ජනයක් යැයි හැඟුණු කල්හි එයට ප්‍රතිචාර දක්වූයේ රූපාත්මක අතින් විශාල නිර්මාණ කිරීමෙන් සහ දෙවි බඹුන්ගෙන් ද බුදුන් පිදුම් ලබන බව දක්වමිනි. සෞන්දර්යාත්මක අගයෙන් අනූනව නිර්මාණය කොට ඇති ගල් විහාර නිසින්න පටිමා ලෙණෙහිත්, විජ්ජාධර ගුහාවේ බුද්ධ ප්‍රතිමාව පසුබිමෙහි ගල් තලයත් ප්‍රතිමාව අවටත් පොළොන්නරු නිර්මාණ සම්ප්‍රදායට ආවේණික විචිත්‍ර හා සංකීර්ණ ශිල්පීය හැකියාව ප්‍රදර්ශිත අවස්ථාවක් වන අතරම බුදුන්ගේ ශ්‍රේෂ්ඨත්වය ද විශද කරයි. විජ්ජාධර ගුහාවේ දී බුදුන් බ්‍රහ්ම සහ විෂ්ණු දෙවිවරුන්ගෙන් වැඳුම් ලබන ආකාරය නිරූපණය කරන්නේ බුදුන්වහන්සේගේ දේවාතිදේව බ්‍රහ්මාතිබ්‍රහ්ම ස්වභාවය පිළිබිඹු කරමිනි.

ආභංග ඉරියව්වෙන් ගල් විහාරයේ සහ ලංකාතිලකයේ හිටි බුද්ධ ප්‍රතිමා ද ත්‍රිභංග ඉරියව්වෙන් තිවංක පිළිමගේ බුද්ධ ප්‍රතිමාව ද නිර්මිතය. ත්‍රිභංග ඉරියව්ව බහුල ලෙස භාවිතයට ගෙන ඇත්තේ දේව රූප සහ ප්‍රභූ රූප නිර්මාණයේ දී ය. පොළොන්නරු යුගයේ දී දේව භක්තිය ව්‍යාප්ත වීමේ ප්‍රතිඵලයක් වශයෙන් බෞද්ධ ඇදහීම්වලට ශ්‍රද්ධාව අබිබවා භක්තිය ප්‍රවේශ විය. එබැවින් දිව්‍යමය ස්වරූපයට සමීප වන උදරබව සහ කරුණාව පිළිබිඹු කිරීමට සමත්වන ත්‍රිභංග ලක්ෂණ පොළොන්නරු යුගයේ බුද්ධ ප්‍රතිමාවට ද ආරෝපණය කර ඇත. එහි දී නිර්මාණ ශිල්පියා බෞද්ධ පරමාර්ථ එක් අතකින් ද හින්දු නිර්මාණ ලක්ෂණ අනෙක් අතින් ද ඇසුරු කළේය. තිවංක ප්‍රතිමා ගෘහය ද සමස්ත වශයෙන් දක්ෂිණ භාරතීය කලා සම්ප්‍රදායන්හි බලපෑම සහ සමකාලීන සමාජ විඥානය කෙරෙහි බලපෑ සංස්කෘත සහ ද්‍රවිඩ සාහිත්‍ය ආභාසය මත ලද නිර්මාණාත්මක අදහස් වාස්තු විද්‍යාත්මකව ආරෝපණය කිරීමට ගත් උත්සාහයක් ලෙස පෙන්වාදිය හැකිය.

ගෘහ අලංකරණයේ ද්වාර ප්‍රවේශ ගත සඳකඩපහණ ද පොළොන්නරු නිර්මාණයේ එක් සුවිශේෂ නිදර්ශනයක් වෙයි. අනුරාධපුර යුගයේ සඳකඩපහණේ කැටයම් වුණු හංස, හස්ති, සිංහ, අශ්ව සහ වෘෂභ රූප වෙනුවට පොළොන්නරු යුගයට අයත් බොහෝ සඳකඩපහණවල ඇත්තේ හංස, හස්ති සහ අශ්ව රූප පමණි. පොළොන්නරු සඳකඩපහණවලින් විශිෂ්ට ම සඳකඩපහණ ලෙස සැලකෙන පොළොන්නරු වටදාගේ ඉහළ වේදිකාවේ උතුරු දොරටුවෙහි සඳකඩපහණේ ඇත්තේ ද සත්ත්ව රූප තුන් වර්ගයකි. එහි සිංහ සහ වෘෂභ රූප දක්නට නැත. වෘෂභයා සහ සිංහයා ශිවගේත් පාර්වතීගේත් වාහන ලෙස සැලකේ. හින්දු සම්ප්‍රදායේ වෘෂභයා සහ සිංහයා පූජ්‍යත්වයට පත්ව ඇති හෙයින් පොළොන්නරු නිර්මාණ ශිල්පියා සඳකඩපහණට තත් සත්ත්වරූප එක් නොකළේය. හින්දු ආගමෙහි පූජ්‍යත්වයට පත් එවැනි සත්ත්ව රූප පා පිස දැමීම

සඳහා වූ කැටයමකට ඇතුළත් කිරීම පොළොන්නරු ශිල්පියා වරදක් සේ සලකන්නට ඇත. ආකෘතිය වෙනස් කරමින්ද, සෞන්දර්යාත්මක ස්වභාවය උද්දීපනය වන සත්ත්ව රූප සහ ලියකම් යොදාගනිමින් ද පොළොන්නරු කලා කෘතිවල විශේෂයෙන් දක්නට ලැබෙන සංකීර්ණ විචිත්‍ර සැරසිලි ක්‍රම මේ සඳකඩපහණේ දී අනුගමනය කර තිබේ.

## නිගමනය

අනුරාධපුර යුගයේ දෘශ්‍ය කලා නිර්මාණ අත්පත්කරගෙන තිබුණු විශිෂ්ට නිර්මාණාත්මක බෞද්ධ කලා ලක්ෂණ පොළොන්නරු නිර්මාණ සම්ප්‍රදායේ දී හින්දු බලපෑම් නිසා පරිහානියට පත්වූයේ යැයි ඇතිව තිබෙන පිළිගැනීම පොළොන්නරු නිර්මාණ අගැයීම කෙරෙහි දැඩි බාධාවකි. හින්දු බලපෑම් නිසා හඳුනාගත් විචිත්‍ර සෞන්දර්යාත්මක නිර්මාණ ලක්ෂණ පොළොන්නරු නිර්මාණ සම්ප්‍රදායට අනන්‍ය මුහුණුවරක් ඇතිකිරීමට සමත් වූ අතර හින්දු සමයේ බලපෑම බෞද්ධාගමික සංකල්ප කෙරෙහි අභියෝගාත්මක වූ කල්හි උක්ත විචිත්‍ර සෞන්දර්යාත්මක නිර්මාණ ලක්ෂණ සහිත සම්ප්‍රදාය ම ඇසුරු කරමින් පොළොන්නරු නිර්මාණ ශිල්පියා කාලීන අවශ්‍යතාවක් සැපයීය.

**ප්‍රමුඛ පදඃ** පොළොන්නරුව, හින්දු, බෞද්ධ, මූර්ති

## ආශ්‍රිත ග්‍රන්ථ

*මහාවංසො.* (1908). සුමංගල හිමි,එච්., දොන් අන්දිරිස් ද සිල්වා, බටුවන්තුඩාවේ, කොළඹ.

*ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය,* 1 කාණ්ඩය, II භාගය, (1972). කැලණියඃ විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය මුද්‍රණාලය.

කුමාරස්වාමි, ආනන්ද, (1962). *මධ්‍යකාලීන සිංහල කලා.* කොළඹ.

මුදියන්සේ, නන්දසේන. (1970). *පැරණි සිංහල ප්‍රතිමා ශිල්පය.* කොළඹ.

රාහුල හිමි, වල්පොල. (1962). *ලක්දිව බුදු සමයෙහි ඉතිහාසය.* කොළඹ.